බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ අංක : 35/2014

මාගේ අංක : කේ 06/සමා අනුමැති/2014,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2014.08.23 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**සිරගොණු සමා අනුමැතිය සඳහා බන්ධනාගාර මූලස්ථානයට එවීම.**

උක්ත කරුණට අදාලව 2014.08.12 වන දින පුණරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවති සාකච්ජාව හා බැඳේ.

එහිදී දීර්ඝකාලින සිරගොණු අනිවාර්ය සිර දඬුවමින් නිදහස් වන දිනයට දින 60 කට පෙර අනුමැතිය සඳහා නොඑවීම සම්බන්ධයෙන් අමාත්‍යතුමා මාගෙන් කරුණු විමසන ලද හෙයින් මින් ඉදිරියට ඔබ විසින් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකර කටයුතු කළයුතු අතර, එසේ නොකරන අවස්ථාවන් හිදී විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ඔබට මෙයින් දන්වමි.

01). දීර්ඝකාලින (වසරකට වැඩි සිර දඬුවම් නියමකර ඇති) සිරකරුවන්ගේ සිරගොණු සමා අනුමැතිය සඳහා බන්ධනාගාර මූලස්ථානයට එවීමේදී සිරකරු අනිවාර්ය සිර දඬුවමින් නිදහස් වන දිනය නිශ්චිත ලෙස ගණනය කිරීමෙන් අණතුරුව එම නිදහස් දිනයට දින 60 කට පෙර මා වෙත ලැබෙන පරිදි අනුමැතිය සඳහා එවිය යුතුය. යම් යම් අවස්ථාවන්හිදී සිරකරුවන්ගේ අනිවාර්ය දඬුවම් අවසානයේ ඇති අනියම් දඬුවම් වලින් නිදහස් දිනය සඳහා අනුමැතියට සිරගොණු යොමුකිරීම සිදුවන බැවින්, මින් ඉදිරියට එම අඩුපාඩු මගහරවාගෙන ඉහත සඳහන් පරිදි දීර්ඝකාලින සිරගොණු සමා අනුමැතිය සඳහා බන්ධනාගාර මූලස්ථානයට යොමුකිරීමට කටයුතු කලයුතුබව දන්වමි.

02). දෙපාර්තමෙන්තු නිත්‍ය නියෝගයන්ට අනුව හෝ විසඳීමට ඇති වෙනත් නඩු සඳහා යම් සිරකරුවකු බන්ධනාගාරයකට මාරුකර ඇති අවස්ථාවකදී එකී සිරකරුගේ නිදහස් දිනය ඉදිරියට දින 60 ක් ඇතුලත යෙදී ඇත්නම්, සිරකරු ඒ වනවිට රඳවා ඇති බන්ධනාගාරය මගින් නිදහස් දිනය පරීක්ෂාකර බලා සිරගොණුව නියමිත දිනයට සමා අනුමැතිය සඳහා බන්ධනාගාර මූලස්ථානයට යොමුකිරීමට කටයුතු කල යුතුය.

චන්ද්‍රරත්න පල්ලේගම,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.